# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,861 - 2014 මැයි මස 02 වැනි සිකුරාදා - 2014.05.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 632 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 642 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය*** **පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 23 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## බලපිටිය ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ බලපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුව පවතින වැඩ/ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු සහ කාර්යාල කාර්ය සහායක තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිරව පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අවම අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 03 | රා. ප. ච. 6/2006(iv) අනුව PL-1, 2006A<br>රු. 11730-10x120-10 x 130-10 x 145-12 x 160-17600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබිය යුතුය. |
| සෞඛ්‍ය කම්කරු | 10 | රා. ප. ච. 6/2006(iv) අනුව PL -1, 2006 A<br>රු. 11730-10 x 120-10 x 130-10 x 145-12 x 160-17600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 8 වන ශ්‍රේණිය (09 වසර) සමත් වී තිබිය යුතුය. |
| කාර්යාල කාර්ය සහයක | 01 | රා. ප. ච. 6/2006 (iv) අනුව PL -1, 2006 A<br>රු. 11730-10 x 120-10 x 130-10 x 145-12 x 160-17600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06)ක් සමත්වී තිබිය යුතුය. |
| විදුලි කාර්මික | 01 | රා. ප. ච. 6/2006(iv) අනුව PL -2,2006 A<br>රු. 12210-10 x 130-10 x 145-10 x 160-12 x 170-18600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත්වී තිබීම සහ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ. ඔවුන් අදාල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් තම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iii) අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයෙකු විය යුතුය.
(iv) අයදුම්කරුවන් මනා සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
(vi) අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.
(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සපුරා තිබිය යුතුය.

04. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
(ii) බලපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
(iii) තෝරාගනු ලබන්නේ වසර 03ක පරිවාස කාලයකට යටත්වය.
(iv) ඉහත සඳහන් කර ඇති බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, දකුණු පළාත් සභාව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා බලපිටිය ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

05. *බඳවා ගන්නා ක්‍රමය* .— අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්‍ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමේ පටිපාටියේ ඇමුණුම් අංක 01 අනුව පහත සඳහන් පරිදි ලබාගත් උපරිම ලකුණු මත බඳවා ගනු ලැබේ.

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02 | අමතර සුදුසුකම් (උපලේඛන 2ට අනුව අදාල නම්) | 10 | |
| 03 | පළපුරුද්ද (උපලේඛන 2ට අනුව අදාල නම්) | 10 | |
| 04 | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 05 බැගින්) | 45 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය) | 05 | |
| | එකතුව | 100 | |

*සටහන* :

1. මූලික සුදුසුකම් පරීක්‍ෂා කිරීම, ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේදී ම සිදුකෙරේ.
2. මූලික සුදුසුකම් සම්පූර්ණ කරනලද අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ දී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

06. *අයදුම්කළ යුතු ආකාරය* :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගන්නා අයදුම්පත් 2014.05.31 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, බලපිටිය ප්‍රාදේශීය සභාව, බලපිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. දක්වා ඇති උපදෙස්වලට පටහැනි අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

ඒ. දයාරත්න ද සිල්වා,
සභාපති,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

2014ක් වූ අප්‍රේල් මස 25 වන දින,
බලපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ බලපිටිය ප්‍රාදේශීය සභාවේ ......................තනතුර සඳහා අයදුම්පත**

01. (i) මුලකුරු සමඟ නම :——————.
    (ii) මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.
04. ස්ථිර පදිංචි ලිපිනය :——————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
07. උපන් දිනය : වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.
08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————. මාස :——————. දින :——————.
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? :——————.
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) (සහතිකවල පිටපත් අමුණන්න) :——————.

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණන්න) :——————.

12. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුතු නම්, :——————.
 (i) තනතුර :——————.
 (ii) සේවය කරන ස්ථානය :——————.
 (iii) පත්වීම් දිනය :——————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද?

14. අයදුම්කරුගේ සහතිකය :
මෙම අයදුම්පතේ ම' විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මගේ අයදුම්පත අවලංගුවීමට යටත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකිරීමට යටත් වන බවත්, මම දනිමි.

——————
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

15. *රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.*

මෙම අයදුම්කරු දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුක්ත බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බව ද, මෙම තනතුර සඳහා තෝරාගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය නිදහස් කළ හැක./නොහැකි බවද ප්‍රකාශ කරමි.

——————
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.

05-08

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

මීගමුව මහ නගර සභාව

මීගමුව මහ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහ නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2014.06.02 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ (කා.සේ.සේ. III) ක්ෂේත්‍ර කම්කරු | 07 | PL1-2006A ආරම්භක වැටුප් පියවර රු. 11,730 (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වැනි වසර සමත් වී තිබිය යුතුය. |
| 02. | සෞඛ්‍ය කම්කරු (කා. සේ. සේ. III) | 04 | PL1-2006A ආරම්භක වැටුප් පියවර රු. 11,730 (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ. |
| 03. | කාර්යාල කාර්ය සහායක (කා. සේ. සේ. II) | 02 | PL1-2006A ආරම්භක වැටුප් පියවර රු. 13,060 (7 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | (සටහන 01 බලන්න) |
| 04. | පුස්තකාල සහායක (කා. සේ. සේ. II) | 02 | PL1-2006A ආරම්භක වැටුප් පියවර රු. 13,060 (7 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | (සටහන 01 බලන්න) |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 05. | දුරකථන ක්‍රියාකරු (කා. සේ. සේ. II) | 01 | PL1-2006A ආරම්භක වැටුප් පියවර රු.13,060 (7 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | (සටහන 01 බලන්න) |
| 06. | වෙළඳසැල් පරිපාලක II ශ්‍රේණිය | 01 | MN1-2006A ආරම්භක වැටුප් පියවර රු.13,120 (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) | (සටහන 02 බලන්න) |
| 07. | රියදුරු | 01 | PL3-2006A ආරම්භක වැටුප් පියවර රු. 12,470 (4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | (සටහන 03 බලන්න) |

*සටහන 01 :*

පුස්තකාල සහායක තනතුර, කාර්යාල කාර්ය සහායක, දුරකථන ක්‍රියාකරු තනතුරු සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරක දී කවර හෝ විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම.

*සටහන 02 :*

*වෙළඳසැල් පරිපාලක තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :*

දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුලුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් විෂයයන් 06 කින් සමත් වී තිබිය යුතුය;

සහ

මනා පෞරුෂයකින් යුක්ත විය යුතු අතර, සිංහල හා දෙමළ භාෂා වලින් කථා කිරීමට හැකියාව තිබිය යුතුය.

*සටහන 03 :*

*රියදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන සුදුසුකම් :*

දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා. පෙළ.) විභාගයෙන් සම්මාන සමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 ක් සමත් වීම. (එක් වරක දී අවම වශයෙන් විෂයයන් 05 ක් වත් සමත් වී තිබිය යුතුය.)

තාර බර හොන්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් තිබිය යුතුය.

වාහන රියදුරකු වශයෙන් වසර 03 ක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.) අවම උස අඩි 05 ක් විය යුතුය. දිවා කාලයේ හා රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

*සේවා කොන්දේසි හා නියමයන් :*

(අ) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(ආ) වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ඇ) තෝරාගනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේනම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් වසර 01 ක වැඩ බැලීමේ කාලයකට යටත්කර බඳවා ගනු ලැබේ.

(ඈ) තෝරා ගනු ලබන්නේ බස්නාහිර පළාතේ මුදල් රෙගුලාසිවලට ද, කලින් කලට බස්නාහිර පළාත් සභාව නිකුත් කරන ලද රෙගුලාසිවලට ද, නොහොත් නියෝග වලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි වලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, යටත්ව කටයුතු කළ යුතුය.

(ඉ) රියදුරු තනතුරට පත් කරනු ලබන සෑම අයෙකුටම කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට යෑමට ඉඩ හරිනු ලැබීමට මත්තෙන්,

1. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුම මිනීම පිණිස පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත්විත විය යුතුය.

2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ පවත්වනු ලබන පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම පරීක්ෂණය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබේ. පරීක්ෂණයෙන් සමත් වීමට නොහැකි වීම මත වැටුප් වර්ධක පමා කිරීමට හේතු වේ.

*වෙනත් පොදු කොන්දේසි :*

01. ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය ඇතුළත් මාසයේ සිට පූර්වාසන්න මාසයේ අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

02. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.

03. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

04. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

05. අයදුම්පත් කැඳවන දින වන විට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

06. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

1. පුස්තකාල සහායක, වැඩ/ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු, කාර්යාල කාර්ය සහායක, සහ දුරකථන ක්‍රියාකරු යන තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂාකර බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95 ට අනුකූලව සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවීමෙන් තෝරාගනු ලැබේ.

2. වෙළඳසැල් පරිපාලක තනතුරට සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 ප්‍රකාර සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 1 1/2 ක ප්‍රශ්න පත්‍රයක් හා සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන පැය 01 ක ප්‍රශ්න පත්‍රයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

3. රියදුරු තනතුර සඳහා ප්‍රථමයෙන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. එසේ සමත් වන අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ එක් නියෝජිතයෙකු, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද සමන්විත මණ්ඩලයක් විසින් පවත්වනු ලබන රියපැදවීමේ නිපුණත්වය මැණීමේ පරීක්ෂණයකින් සමත්විය යුතුය.

නාගරික කොමසාරිස්,
මීගමුව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

මීගමුව මහ නගර සභාව

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම :——————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————.
3. ජාතික හැඳුනුම්පත් අංකය:——————.
4. ස්ථිර පදිංචි ලිපිනය:——————.
5. තැපැල් ලිපිනය:——————.
6. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————.
7. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————.
8. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බලප්‍රදේශය:——————.

9. උපන් දිනය:————.
10. 2014.06.02 දිනට වයස:————.
11. අධ්‍යාපන සුදුසුකම් (ඡායා පිටපතක් ඇමිණිය යුතුයි):————.
12. පළපුරුද්ද:————.
13. වෘත්තීය සුදුසුකම් (ඡායා පිටපතක් ඇමිණිය යුතුයි):————.
14. වෙනත් සුදුසුකම්:————.
15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවකු කර තිබේ ද යන වග:————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සකු කිරීමට බඳවාගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත් යටත්වන බව හොඳාකාරවම දනිමි.

දිනය:————.

————,
අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන....................මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ...................වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
තනතුර:————.
දිනය:————.

05-18

---

**කොලොන්නාව නගර සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

කොලොන්නාව නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. කොලොන්නාව නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් හා දැනටමත් කොලොන්නාව නගර සභාවේ කොන්ත්‍රාත්, ආදේශක, අනියම්, තාවකාලික පදනම මත කුමන හෝ තනතුරක සේවයේ නියුක්ත අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයැදුම්පත්‍ර සම්පූර්ණ කර "ලේකම්, කොලොන්නාව නගර සභාව, කොලොන්නාව" යන ලිපිනයට 2014.05.19 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III පන්තිය | මාසික රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 රු. 17,600 රා.ප.ච. 06/2006 (iv) අනුව PL1- 2006 - A | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 5 ශ්‍රේණිය/6 වසර සමත්වී තිබිය යුතු වේ.<br><br>(ගස් කැපීම, පෙදරේරු, වැඩ, ගල් අතුරා තාර දැමීම හා පාරවල් කොන්ක්‍රීට් කිරීම, වඩු වැඩ, උද්‍යාන අලංකරණ හැකියාව ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) |

| අනු. අංකය | තනතුරු නාමය | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| 02. | සෞඛ්‍ය කම්කරු III පංතිය | මාසික රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 රා.ප.ච. 06/2006 (iv) අනුව PL1 - 2006 - A | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ. (කානු ශුද්ධ පවිත්‍ර කිරීම, වැසිකිළි ශුද්ධ පවිත්‍ර කිරීම, ගලි බවුසරයේ සේවය කිරීමට හැකියාව ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
(ii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය;
(iii) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ත් 45 ත් අතර විය යුතු ය. (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය;
(v) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ;
(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොලොන්නාව නගර සභාවේ ලේකම් සතුය.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු වේ;
(ii) බඳවා ගනු ලබන සේවකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ;
(iii) මීට අමතරව ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන වෙනත් නියෝගවලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

*04. අයදුම් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ 4 ප්‍රමාණයේ) අයදුම්පතක් සකස් කර, අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2014.05.19 දිනට පෙර ලේකම්, කොලොන්නාව නගර සභාව, කොලොන්නාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල පිටපත් එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී විසින් නිකුත් කළ පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
(iv) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික;
(v) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
(vi) පොලිස් වාර්තාව.

05. පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් ඔබ පත්වීමක් ලැබීමට සුදුස්සකු ලෙස නොසැලකිය යුතු ය.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කොලොන්නාව නගර සභාවේ ලේකම් සතු වන්නේ ය.

කේ. ටී. ගම්ලත්,
ලේකම් (වැ.බ.)
කොළොන්නාව නගර සභාව.

2014 ක් වූ අප්‍රේල් මස 11 වැනි දින,
කොළොන්නාව නගර සභාවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොලොන්නාව නගර සභාවේ ........................................... තනතුර සඳහා බඳවා ගැනීම

01. *(අ)* මුලකුරු සමග නම :——————.

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම :——————.

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.

03. ස්ථිර ලිපිනය :——————.

04. *(අ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? :——————.

*(ආ)* එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :——————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

07. විවාහක/අවිවාහක තත්ත්වය :——————.

08. දුරකථන අංකය :——————.

09. උපන් දිනය :——————.

වර්ෂය :——————. මාසය :——————. දිනය :——————.

10. 2014.05.19 දිනට වයස

වර්ෂ : :——————.මාස : :——————. දින : :——————.

11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————.

12. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) :——————.

13. සේවා පළපුරුද්ද :——————.

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන. .................. මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..................වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට/අවවාද කිරීමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

——————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
(නිල මුද්‍රාව යොදන්න).

දිනය :——————.

නම :——————.

පදවි නාමය :——————.

දෙපාර්තමේන්තුව/ආයතනය :——————.

05-23

## අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය හා ශිල්පීය නොවන ආයතනගත තනතුරුවල පුරප්පාඩු පිරවීම

අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ තනතුරු වලට බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

*උපලේඛනය*

| *තනතුරු නාමය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු (III ශ්‍රේණිය) | රා.ප.ච. 6/2006 iv පී.එල්. - 1 - 2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| සෞඛ්‍ය කම්කරු (III ශ්‍රේණිය) | රා. ප. ච. 6/2006 iv පී. එල්. - 1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව තිබීම. |
| රියැදුරු (III ශ්‍රේණිය) | රා. ප. ච. 6/2006 iv පී. එල්. -3-2006A රු. 12,470- 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු. 18,860 | දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හය (06) ක් සමත් වී තිබිය යුතු ය. පුරප්පාඩු පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය. මෝටර් රථ රියදුරන් රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද තිබිය යුතු ය. |
| මුරකරු (III ශ්‍රේණිය) | රා.ප.ච. 6/2006 iv පී. එල්. - 1 - 2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 2 ක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබිය යුතු ය. |

*02. බඳවා ගැනීමේ සුදුසුකම්* :

* අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය;
* අයදුම්කරුවන්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය;
* අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය;
* අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් නොලැබූවකු විය යුතු ය;
* එක් අයදුම්කරුවකුට එක් තනතුරක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකිය.
* අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

*03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු ය;

3.2 පත්වීමේ දින සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ ස්ථිර කරනු ලැබේ;

3.3 මෙම බඳවා ගැනීමේ කොන්දේසි වලට අමතරව ආයතන සංග්‍රහයේ, කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥාපනත්/පනත්වල විධිවිධාන වලට ද, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතු ය;

3.4 2007.05.28 දිනැති රා. පරි. ච. ලේ. අංක 7/2007 අනුව පත්වීමේ දින සිට වසර 05 ක් ඇතුළත, සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අමතරව අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතු ය;

3.4 III වැනි පංතියට නියමිත වැටුප් පරිමාණයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

*04. බඳවා ගැනීමේ ක්‍රමය :*

ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතුරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. රියදුරු සඳහා වෘත්තීය පරීක්ෂණයකට භාජනය කෙරේ. සම්මුඛ පරීක්ෂණයේ දී අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමේ යහපත් සේවා කාලයක් සපුරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.

*05. අයදුම් කළයුතු ආකාරය :*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම් පස ඉහළ කෙළවරේ ලියා 2014.05.25 වැනි දිනට පෙර "සභාපති, අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව, අඟුණකොළපැලැස්ස" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත දිනට නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. හැඳුනුම්පතේ ඡායා පිටපතක්;
4. පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
5. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්;
6. වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතික.

එම්. විජේරත්න,
සභාපති,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 25 වැනි දින,
අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***අඟුණකොළපැලැස්ස ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික මට්ටමේ ශිල්පීය හා ශිල්පීය නොවන............................. තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ අයදුම් පත්‍රය***

1. මුලකුරු සමග නම :————————.
2. සම්පූර්ණ නම :————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
4. උපන් දිනය : වර්ෂය:————————. මාසය:————————. දිනය:————————.
5. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස, අවුරුදු:————————. මාස:————————. දින:————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය:————————.
7. විවාහක/අවිවාහක බව:————————.
8. ජාතිය:————————.
9. ස්ථිර ලිපිනය:————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?, එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව:————————.
11. අධ්‍යාපන සුදුසුකම්:————————.
    අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර:

පළමු වතාව
වර්ෂය හා මාසය:————————.
විභාග අංකය:————————.

දෙවන වතාව
වර්ෂය හා මාසය:————————.
විභාග අංකය:————————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 1. | |
| 2. | | 2. | |
| 3. | | 3. | |
| 4. | | 4. | |
| 5. | | 5. | |
| 6. | | 6. | |
| 7. | | 7. | |
| 8. | | 8. | |

13. වෙනත් සුදුසුකම්:——————.
14. වෘත්තීය සුදුසුකම්:——————.
15. සේවා පළපුරුද්ද:——————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගනු ලැබීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් පැහැදිලිවම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

05-49

---

# පළාත් පාලන නිවේදන

## වැලිගම ප්‍රාදේශීය සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වැනි කොටස පලාත් පාලනය 2013.09.20 වැනි දින අංක 1829 දරන *ගැසට් පත්‍රයේ* මා විසින් පළ කරන ලද දැන්වීම සංශෝධනය කර ප්‍රකාශයට පත් කරමි.

මාර්ග ලියාපදිංචි කිරීම

වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මිදිගම නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පහත සඳහන් මාර්ගය "මිදිගම ඉබ්බාවල පාතේගම පාරෙන් පටන් ගෙන ඉධාන ප්‍රදේශයට යන මාර්ගය ඉධාන ii වන පටුමග ලෙස නිවැරදි විය යුතුය." එය මිදිගම ඉධාන ii වන පටුමග ලෙස නම් කළ යුතු බවට වැලිගම ප්‍රාදේශීය සභාවේ 2014.04.07 දින පැවති මාසික සභා රැස්වීමේ දී තීරණ අංක 04.6 යටතේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත වී ඇතිබව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *මාර්ගයේ නම* | *දිග* | *පළල* |
|---|---|---|
| මිදිගම ඉධාන පාර ii වන පටුමග | 207m | 3.5m |

පුෂ්පකුමාර බැට්ටගේ
සභාපති
වැලිගම ප්‍රාදේශීය සභාව

2014 අප්‍රේල් මස 08 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය සභාවේ දී ය.

05-07

---

## කුච්චවේලි ප්‍රාදේශීය සභාව

සෝගාතක ආඥාපනතට අනුව බලපත්‍ර ගාස්තු - 2014
272 වැනි අධිකාරය 7(2) වගන්තිය යටතේ දැන්වීම

ඉහත සෝගාතක ආඥාපනතේ අංක 272 වැනි අධිකාරය 17(2) වගන්තියට ප්‍රකාරව පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එකී නම් ඉදිරියෙන් විස්තර දක්වා ඇති ස්ථානයන්හි 2014.12.31 දක්වා මස් කඩ පවත්වාගෙන යාම පිණිස ගෝඝාතක බලපත්‍ර ඉල්ලුම් කර ඇත.

මෙම බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳව කුච්චවෙලි ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය පිටපත් දෙකකින් යුත් සවිස්තර ලියවිල්ලක් වශයෙන් සකස් කර මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වී දින දාහතරක් (14) ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය 7(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

| *අනු. අංකය* | *අයදුම්කරුගේ නම* | *ලිපිනය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *ව්‍යාපාර ස්ථානයේ ලිපිනය* |
|---|---|---|---|---|
| 01 | නසුරුදීන් රෆීක් | ඉක්බාල් නගර් - නිලාවේලි | ගවමස් කඩය | ඉක්බාල් නගර් |
| 02 | එස්. නසීර් | කොට්ඨාස අංක 04-ඉරකකන්ඩි | ගවමස් කඩය | වාලෛඋෟත්තු |
| 03 | ටී. සුල්පික් | කොට්ඨාස අංක 04-ඉරකකන්ඩි | ගවමස් කඩය | ඉරකකන්ඩි |
| 04 | වයි. ටී. ඒ. මුසම්මිල් | කාසීම් නගර් - කුච්චවේලි | ගවමස් කඩය | කුච්චවේලි |
| 05 | ඒ. ඒ. ඉස්මායිල් | පුඩවකට්ටු - සෙන්දූර් | ගවමස් කඩය | පුඩවකට්ටු |
| 06 | වයි. යූ. රෝයස් | කාසීම් නගර් - කුච්චවෙලි | ගවමස් කඩය | සලපයාරු |
| 07 | උ. සලාහුදීන් | කොට්ඨාස අංක 04 - පුල්මුඩේ | ගවමස් කඩය | පුල්මුඩේ අංක 02 |
| 08 | කාදර් සායිවු අමීන් | කොට්ඨාස අංක 04 - නිලාවේලි | ගවමස් කඩය | අරෆාත් නගර් - පුල්මුඩේ |
| 09 | සෙයියදු අහමදු ඉල්මුදීන් | කොට්ඨාස අංක 01 - නිලාවේලි | කුකුල්මස් කඩය | කොට්ඨාස අංක 08 - නිලාවේලි |
| 10 | අබුබක්කර් ඉබ්‍රාලෙබ්බෙ | ගෝපාලපුරම් - නිලාවේලි | කුකුල්මස් කඩය | ගෝපාලපුරම් |
| 11 | මුහම්මදු ඉබ්‍රාහීම් මන්දූම් | කොට්ඨාස අංක 04 - ඉරක්කන්ඩි | කුකුල්මස් කඩය | ඉරක්කන්ඩි |
| 12 | මුහම්මදු අබ්දුල්ලාහි මුහම්මදු හිල්මි | ඉක්බාල් නගර් - නිලාවේලි | කුකුල්මස් කඩය | ඉක්බාල් නගර් |
| 13 | අබ්දුල් රහීම් මුහම්මඩ් රියාස් | කොට්ඨාෂ අංක 01 - නිලාවේලි | කුකුල්මස් කඩය | කොට්ඨාස අංක 02 නිලාවේලි |
| 14 | අලියුල්ලාහ් මුහම්මදු ඉර්සාත් | වාලෛඋෟත්තු - නිලාවේලි | කුකුල්මස් කඩය | වාලෛඋෟත්තු |
| 15 | මුහියද්දීන් කච්චු මුහම්මදු | ඉක්බාල් නගර් - නිලාවේලි | කුකුල්මස් කඩය | කුඹුරුපිටි |
| 16 | අබ්දුල් කපූර් රෝජස් | කාසීම් නගර් - කුච්චවේලි | කුකුල්මස් කඩය | කුච්චවේලි |
| 17 | සෙයියදු අහමදු නෆාර්දීන් | පුඩවකට්ටු - තිරියාය | කුකුල්මස් කඩය | පුඩවකට්ටු |
| 18 | රාකුබ් මුහම්මදු මිල්හාන් | ජායා නගර් - කුච්චවේලි | කුකුල්මස් කඩය | ජායා නගර් |
| 19 | මුහම්මදු ඉස්මායිල් මුහම්මදු නලීම් | කොට්ඨාස අංක 04 - පුල්මුඩේ | කොට්ඨාස අංක 01 කුකුල් මස් කඩය | කොට්ඨාස අංක 01 - පුල්මුඩේ |
| 20 | කච්චු මුහම්මඩ් අබ්දදුල් ගපූර් | කොට්ඨාස අංක 03 - පුල්මුඩේ | කොට්ඨාස අංක 02 කුකුල් මස් කඩය | කොට්ඨාස අංක 02 - පුල්මුඩේ |
| 21 | අබ්දදුල් ගපූර් මුහම්මඩ් මුසව්වරි | කොට්ඨාස අංක 03 - පුල්මුඩේ | කොට්ඨාස අංක 03 කුකුල් මස් කඩය | කොට්ඨාස අංක 03 - පුල්මුඩේ |
| 22 | මුහම්මදු මීරාසායිබු රහ්මතුල්ලාහ් | කොට්ඨාස අංක 01 - පුල්මුඩේ | කොට්ඨාස අංක 04 කුකුල් මස් කඩය | කොට්ඨාස අංක 04 - පුල්මුඩේ |

ඒ. මුබාරක්,
සභාපති.

කුච්චවේලි ප්‍රාදේශීය සභාව,
නිලාවේලි.

05-50

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| මැයි | 2014.05.02 | සිකුරාදා | 2014.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.09 | සිකුරාදා | 2014.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.16 | සිකුරාදා | 2014.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.23 | සිකුරාදා | 2014.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.30 | සිකුරාදා | 2014.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.